සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

# අනාවරණ පරීක්ෂණය - 2026
# இனங்காணல் பரீட்சை - 2026
# Diagnostic Test - 2026

53825

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය එකයි |

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. ඓතිහාසික මූලාශ්‍ර අතර මහා වංශයට සුවිශේෂී බවක් හිමිවන්නේ,
    i. එහි ඇතුළත් තොරතුරු සියල්ල නිවැරදි නිසාය.
    ii. එය ලංකාවේ පළමු වංශකතාව වූ නිසාය
    iii. එහි ලංකා ඉතිහාසය අඛණ්ඩව රචනා කර ඇති නිසාය.
    iv. එහි ආගමික තොරතුරු වැඩි වශයෙන් ලියවී ඇති නිසාය.

02. මහනුවර සිට කෝට්ටේ යුගය දක්වා ලියැවුණු ග්‍රන්ථ අතරින් ප්‍රශස්ති කාව්‍යයකට උදාහරණයක් ලෙස පෙන්වා දිය හැකි ග්‍රන්ථය කුමක් ද?
    i. පූජාවලිය  ii. පැරකුම්බා සිරිත  iii. රාජාවලිය  iv. නිකාය සංග්‍රහය

03. තම අත්දැකීම් ඇසුරින් ලංකාව පිළිබඳ තොරතුරු සටහන් කරන ලද චීන ජාතික භික්ෂුව කවුරුන් ද?
    i. ෆාහියන්  ii. හියුංසැං  iii. චෙන්හෝ  iv. පා-ඕ-වාං

04. විහාරයක් ආරාමයක් ආදිය කරවීමෙන් පසු ඒ අසල ඇති ගල් පර්වතයක ඒ පිළිබඳ සටහන් කොට ලියවන ලිපි හැඳින්වෙන නම කුමක් ද?
    i. ටැම් ලිපි  ii. ගිරි ලිපි  iii. ලෙන් ලිපි  iv. පුවරු ලිපි

05. ජනතාව විසින් අතහැර දමන ලද වැව් ගම්මාන හැඳින්වූයේ මින් කුමන නමකින් ද?
    i. ඔළගම්  ii. පට්ටානගම්  iii. පරික්ඛිත්ත ගම්  iv. කසීකාරගම්

06. පහතරට තෙත් කලාපීය ලෙන්වල විසූ ජනයා බහුල වශයෙන් ආහාරයට ගන්නා ලද සත්ත්වයෙකු ලෙස සැලකිය හැක්කේ මින් කුමන සත්ත්වයා ද?
    i. මුවා  ii. ගෝනා  iii. කළපු බෙල්ලන්  iv. ගස් ගොලුබෙල්ලන්

07. ප්‍රාග් ඓතිහාසික ජනාවාසයක් වූ අත්තනගොඩ අලුලෙන පිහිටා ඇත්තේ මින් කුමන පරිසර කලාපයේ ද?
    i. වියළි කලාපය  ii. පහතරට අතරමැදි වියළි කලාපය
    iii. තෙත් කලාපය  iv. අර්ධ ශුෂ්ක කලාපය

08. පරුමකවරුන් සමග සුහදත්වයක් ගොඩ නගා ගනිමින් බලය මධ්‍යගත කිරීමේ ක්‍රියාවලියට යොමු වූ පාලකයා කවරෙක් ද?
    i. පණ්ඩුකාභය රජු  ii. දුටුගැමුණු රජු
    iii. වසභ රජු  iv. දේවානම්පියතිස්ස රජු

09. ආසියාවේ ප්‍රචලිත රාජ්‍යත්ව සංකල්පයක් වූ පර්වතරාජ සංකල්පය ලංකාවේ දී භාවිත කළ පාලකයෙකු සඳහා උදාහරණයකි.
    i. පළමු කාශ්‍යප රජු  ii. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු
    iii. මහසෙන් රජු  iv. සිරිසඟබෝ රජු

10. කුඩා වැව් පද්ධති භාරව කටයුතු කරන ලද්දේ,
    i. පරුමක ය.  ii. ගමික ය.  iii. මපුරුමුකා ය.  iv. ගෘහපති ය.

11. වෙළඳාම සඳහා ලංකාවට පැමිණි අරාබි ජාතිකයන් ලංකාව හැඳින්වීමට යොදන ලද නාමය වූයේ
    i. තැප්‍රොබේන් ය.  ii. සිලෝන් ය.  iii. සෙරන්ඩිබ් ය.  iv. තම්බපණ්ණි ය.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers  Model Answers - Study Resources
iexamhub
CamScanner

12. පැරණි ශ්‍රී ලංකාවේ පැවති කර්මාන්ත කිහිපයක් පළමු තීරුවේ ද ඒවායේ නිරත වූ ශිල්පීන් හැඳින්වීමට යොදන ලද නම් කිහිපයක් දෙවන තීරුවේ ද දක්වා ඇත. 1 හා 2 තීරු ගලපන ලද විට නිවැරදි පිළිතුර වන්නේ,

| 1 තීරුව | 2 තීරුව |
|---|---|
| 1. රන් කර්මාන්ත | A. මණිකාර |
| 2. යකඩ කර්මාන්ත | B. තුලධර |
| 3. මැණික් කර්මාන්ත | C. කබර |
| 4. ඇත්දත් කැටයම් | D. දටික |

i. ACDB    ii. BCAD    iii. CBAD    iv. BCDA

13. අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව ලංකාවේ පැවති පැරණි තාක්ෂණය පිළිබඳ මූලික සාධක හමුවන ස්ථානයකි.

i. සීගිරි රජ මාලිගය    ii. කුට්ටම් පොකුණ    iii. ආලාහන පිරිවෙන    iv. රුවන්වැලි සෑ මලුව

14. සංඝමිත්තා තෙරණිය විසින් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දකුණු ශාඛාවක් ගෙන එන ලද මෙරට උතුරු වෙරළේ පිහිටි තුඩා වරාය කුමක් ද?

i. දඹකොළ පටුන    ii. ලංකාපටුන    iii. මහාතිත්ථ    iv. ගෝකණ්ණ

15. පණ්ඩුකාභය රජු විසින් සොත්ථි ශාලා හා සිවිකා ශාලා නමින් ගොඩනැගිලි විශේෂයක් ඉදිකරනු ලැබුවේ කුමන ආගමිකයන් සඳහා ද?

i. ඉස්ලාම්    ii. ජෛන    iii. බ්‍රාහ්මණ    iv. බෞද්ධ

16. ස්වභාවිකව පිහිටි කඳු දෙකක් අතර ඇති ගල් පර්වතයක් තෝරාගෙන ඒ මත වැව් බැම්ම ඉදිකිරීමෙන් බලාපොරොත්තු වූයේ,

i. වැව් බැම්ම රළ පහරේ බාදනයෙන් ආරක්ෂා කර ගැනීමයි.
ii. වැව් බැම්මෙ ශක්තිය වැඩි කිරීමයි.
iii. වැව් බැම්මේ ඍජු බව පවත්වා ගැනීමයි.
iv. වැව් බැම්ම ගිලා බැසීමෙන් වළක්වා ගැනීමයි.

17. ස්වභාවිකව හමන සුළං බලය යොදාගෙන යකඩ නිස්සාරණය සඳහා භාවිත කළ උඳුන් හමු වූ ස්ථානයකට උදාහරණයක් වනනේ,

i. බළංගොඩ සමනල වැවයි    ii. සීගිරියේ අලකොළ වැවයි
iii. බෙරගල සොහොන් ගැබය    iv. උඩරංචාමඩම නේවාසික ස්ථානයයි.

18. මහියංගනයට දකුණු දෙසින් මහවැලි ගඟ හරස් කොට ඉදිකරණ ලද අමුණ වන්නේ,

i. ඇලහැර අමුණයි    ii. රිදීබැඳි අමුණයි
iii. මිනිපේ අමුණයි    iv. හත්තොට අමුණයි.

19. රජුගෙන් පසු රජුගේ සහෝදරියකගේ පුතෙකුට රජකම ලැබුණු සම්ප්‍රදාය පැවති යුගය වූයේ,

i. අනුරාධපුර යුගය යි.    ii. දඹදෙණි යුගය යි.
iii. මහනුවර යුගය යි.    iv. ගම්පොළ යුගය යි.

20. පැරණි ශ්‍රී ලංකාවේ හේන් ගොවියන්ගෙන් අයකර ගෙන ඇතැයි සැළකෙන බදු වර්ගය වූයේ,

i. කැති අඩ    ii. දකපති    iii. බොජකපති    iv. මතරමපිබක

- පහත **A** සිට **D** තෙක් ප්‍රකාශ ඇසුරින් 21 - 23 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A.** ඉබන් බතුතා ලංකාවට පැමිණීම
**B.** පාලි ජාතකට්ඨකතාව සිංහලයට පරිවර්තනය කිරීම
**C.** සපුමල් කුමරු ලවා වන්නි ජනපද යටත් කර ගැනීම.
**D.** චන්ද්‍රභානු ලංකාව ආක්‍රමණය කිරීම.

21. ඉහත දැක්වෙන සිදුවීම් අතරින් කෝට්ටේ රාජ්‍යයට අයත් සිදුවීම නම්,

i. **A.**    ii. **B.**    iii. **C.**    iv. **D.**

22. ඉහත **D** අකුරින් දැක්වෙන ආක්‍රමණයෙන් ශ්‍රී ලංකාව මුදවා ගත පාලකයා වූයේ,

i. දෙවන පරාක්‍රමබාහු ය.    ii. තෙවන පරාක්‍රමබාහු ය.
iii. පළමු විජයබාහු ය.    iv. පළමු බුවනෙකබාහු ය.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
CamScanner

23. ඉහත සිදුවීම් අනුපිළිවෙලින් දැක්වූ විට නිවැරදි පිළිතුර වන්නේ,

i. DBAC ii. BDAC iii. DBCA iv. BACD

24. දෙවන නාගරිකරණ සමයේ ලංකාවේ ප්‍රධානතම ආර්ථික බෝගයක් වූයේ මින් කුමන බෝගය ද?

i. ගම්මිරිස් ii. කෝපි iii. කුරුඳු iv. තේ

• 25 - 26 ප්‍රශ්න සඳහා පහත ග්‍රන්ථ උපයෝගී කරගන්න.

A. පූජාවලිය B. සිදත් සඟරාව C. තිසර සංදේශය D. ගුත්තිල කාව්‍යය

25. ඉහත ග්‍රන්ථ අතුරින් දඹදෙණි යුගයේ රචිත ග්‍රන්ථ ලෙස හැඳින්වෙන්නේ,

i. AC ii. BC iii. AB iv. BD

26. ව්‍යාකරණ ග්‍රන්ථයක් ලෙස සැලකිය හැකි ග්‍රන්ථය වන්නේ,

i. A ii. B iii. C iv. D

27. සීතාවක පළමු රාජසිංහ රජු උඩරට ආක්‍රමණය කරන විට උඩරට පාලකයා මින් කවරෙක් ද?

i. යමසිංහ බණ්ඩාර ii. වීරසුන්දර බණ්ඩාර
iii. කරලියද්දේ බණ්ඩාර iv. ජයවීර බණ්ඩාර

28. පහත දැක්වෙන රාජධානි අතුරින් මලය රට පිහිටි රාජධානියක් වන්නේ කුමන රාජධානිය ද?

i. ගම්පොළ ii. දඹදෙණිය iii. යාපහුව iv. කෝට්ටේ

29. පහත දැක්වෙන පුද්ගල කණ්ඩායම් අතරින් ඍජුවම නිෂ්පාදනයට සම්බන්ධ වූයේ කවරෙක් ද?

i. බෞද්ධ සංඝ ii. රජු iii. සමාජ ප්‍රභූන් iv. කුඩීන්

• 30 - 31 දක්වා පිළිතුරු සැපයීමට A, B, C, D ප්‍රකාශ භාවිත කරන්න.

A. ආගමික රසවින්දනයට මුල්තැන දීම.
B. ජාතික රාජ්‍ය බිහිවීම.
C. පුද්ගලයා වැදගත් කොට සැළකීම.
D. උල් කේතු රූපාකාර ශිඛර සහිත ගොඩනැගිලි ඉදිවීම.

30. මින් පුනරුද යුගයට පෙර යුරෝපය තුළ දක්නට ලැබුණු ලක්ෂණ අතුළත් පිළිතුර වන්නේ,

i. BC ii. AD iii. AC iv. BD

31. මින් පුනරුද යුගයෙන් පසු යුරෝපයේ දක්නට ලැබුණු ලක්ෂණයක් වන්නේ,

i. AD ii. BC iii. BD iv. AC

32. පුනරුදය ඇතිවීම කෙරෙහි බලපෑ ආසන්නතම හේතුව ලෙස සැළකෙන්නේ,

i. වෙළඳාමේ දියුණුව ii. පල්ලියේ ආධිපත්‍ය විවේචනයට ලක්වීම.
iii. කොන්ස්තන්තිනෝපලය තුර්කින් අල්ලා ගැනීම. iv. බුද්ධි ප්‍රබෝධයක් ඇතිවීම.

• 33 - 34 ප්‍රශ්න සඳහා පහත වගුව භාවිත කරන්න.

| නිර්මාණය | සම්බන්ධ පුද්ගලයා | සම්බන්ධ ක්ෂේත්‍රය |
|---|---|---|
| A. ජෙනී යන්ත්‍රය | D. ජේම්ස් වොට් | G. පේෂ කර්මාන්තය |
| B. වාෂ්ප එංජිම | E. හෙන්රි කෝට් | H. ගල් අඟුරු කර්මාන්තය |
| C. රෝලර් යන්ත්‍රය | F. ජේම්ස් හාග්‍රිව්ස් | I. යකඩ හා වානේ කර්මාන්තය |

33. නූල් කැටීම වේගවත් කිරීම හා සම්බන්ධව දැක්වෙන පිළිතුර කුමක් ද?

i. AFG ii. AFI iii. AEG iv. BEI

34. ගල්අඟුරු කර්මාන්තය පමණක් නොව සෑම කර්මාන්තයක් සඳහාම භාවිත කළ හැකි නිර්මාණය හා එය නිපදවූ පුද්ගලයා නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

i. AE ii. BD iii. CD iv. BE

35. කාර්මික විප්ලවයේ කෘෂිකාර්මික දියුණුව සඳහා භාවිතා කරන ලද ශෂ්‍ය මාරු ක්‍රමයේ ප්‍රධානතම වාසිය නම්,

i. නිෂ්පාදනය යාන්ත්‍රීකරණය වීමයි. ii. ලෙඩ රෝග ව්‍යාප්තිය අවම වීමයි.
iii. වැපිරීමට ඇති බීජ ප්‍රමාණය අවම වීමයි iv. සත්ව පාලනය දියුණු වීමයි.


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

36. පහත දැක්වෙන ස්ථාන අතරින් ඉංග්‍රීසින් ඉන්දියාවේ පිහිටුවන ලද වෙළඳ මධ්‍යස්ථාන පමණක් ඇති පිළිතුර තෝරන්න.

A - කරිකාල්

B - මදුරාසිය

C - පොන්ඩිචෙරි

D - කල්කටා

i. AC ii. AD iii. BD iv. BA

37. ඉංග්‍රීසින් පළමු වරට උඩරට ආක්‍රමණය කරන විට මුහුදුබඩ ප්‍රදේශ පාලනය කරන ලද ආණ්ඩුකාරවරයා,

i. රොබට් බ්‍රවුන්රිග්ය ii. ෆෙඩ්රික් නෝර්ත් ය.

iii. තෝමස් මේට්ලන්ඩ්ය. iv. හෙන්රි වෝඩ්ය.

38. එඩ්වඩ් බාන්ස් විසින් ඉදිකරන ලද ලංකාවේ ප්‍රථම මහා මාර්ගය ඉදිවූයේ මින් කවර නගර දෙක අතර ද?

i. කොළඹ - ගාල්ල ii. මහනුවර - යාපනය

iii. කොළඹ - මහනුවර iv. ගාල්ල - මහනුවර

39. උඩරට රාජ්‍ය ඉංග්‍රීසින්ට නීත්‍යානුකූලවම හිමිවූයේ පහත සඳහන් කවර සිදුවීමෙන් අනතුරුව ද?

i. ක්‍රි. ව. 1815 දී උඩරට ගිවිසුම අත්සන් කිරීමෙන් පසු

ii. ක්‍රි. ව. 1848 දී නිදහස් අරගලය ජයග්‍රහණය කිරීමෙන් පසු

iii. ක්‍රි. ව. 1818 දී උඩරට ප්‍රකාශය අත්සන් කිරීමෙන් පසු

iv. ක්‍රි. ව. 1802 දී කිරීටයේ යටතේ විජිතයක් බවට පත්වීමෙන් පසු

40. 1815 උඩරට යටත් කර ගැනීම සඳහා පුරෝගාමී මෙහෙවරක් ඉටුකරන ලද බ්‍රිතාන්‍ය සිවිල් නිලධාරියා වූයේ,

i. ෆෙඩ්රික් නෝර්ත් ය. ii. ජෝන් ඩොයිලි ය.

iii. එමර්සන් ටෙනන්ට් ය. iv. ටොරින්ටන් සාමි ය.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අනාවරණ පරීක්ෂණය - 2026
இனங்காணல் பரீட்சை - 2026
Diagnostic Test - 2026

53831

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය තුනයි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

01. අ. (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

කිරිඳි ඔය, කලා ඔය, හුරුළු වැව, ඉරණමඩු වැව, මිහින්තලේ / මිනිහාගල්කන්ද, මාතොට, දේවනගර (දෙවුන්දර), පොම්පරිප්පු, කෝට්ටේ,
මහනුවර, දඹකොළ පටුන, කෝනේශ්වරම් කෝවිල

(ලකුණු 12)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

රෝමය, පර්සියන් බොක්ක, බොම්බාය, මලය අර්ධද්වීපය, ලිස්බන්, ලන්ඩන්

(ලකුණු 06)

ආ. (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

**A.** අනුරාධපුර රාජධානියේ ප්‍රථම රජතුමා කවරෙක් ද?

**B.** දෙවන රාජසිංහ රජු සමයේ සිරකරුවෙකුව සිට ලංකාව පිළිබඳ ග්‍රන්ථයක් රචනා කළ ඉංග්‍රීසි ජාතිකයා කවුද?

**C.** කාර්මික විප්ලව සමයේ ගුවන් විදුලිය නිපදවන ලද පුද්ගලයා කවුද?

**D.** ප්‍රථම වරට මුද්‍රණ යන්ත්‍රයක් නිපදවන ලද පුද්ගලයා නම් කරන්න. (ලකුණු 04)

- **A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) (i) මෙම රූපයෙන් දැක්වෙන රජු නම් කරන්න.
(ii) මෙම ප්‍රතිමාව දක්නට ලැබෙන ස්ථානය කුමක් ද?
(iii) මෙම රජු දූතයන් යවන ලද රට කුමක් ද?
(iv) එම දූත ගමනේ අරමුණ කුමක් ද?



A රූපය

(ලකුණු 04)

(iii) (i) මෙම රූපය නම් කරන්න.
(ii) මෙය නිපද වූ පුද්ගලයා කවුරුන් ද?
(iii) මෙය කුමන ක්ෂේත්‍රයක් හා සම්බන්ධ වේ ද?
(iv) මෙහි ප්‍රයෝජනයක් ලියන්න.



B රූපය

(ලකුණු 04)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

## II කොටස

02. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ව්‍යාප්ත වූ පරිසර කලාප තුනක් ලියන්න. (ලකුණු 3)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අවමංගල්‍ය චාරිත්‍රවල කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 4)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ දී මිනිසා ලැබූ දියුණුව නිදසුන් දෙකක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 5)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක තුනක් විස්තර කරන්න. (ලකුණු 6)

03. (i) ශ්‍රී ලංකාවේ මධ්‍යගත පාලනයට සම්බන්ධ පහත පුද්ගලයන්ගේ නිල නාම ලියන්න.

A. කාසි අච්චු ගැසීමේ ප්‍රධානියා

B. වෙළඳ කටයුතු ප්‍රධනියා

C. අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා (ලකුණු 3)

(ii) පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම හා සම්බන්ධ රජවරුන් ලියන්න.

A. දසවන වර්ෂයේ දී ග්‍රාමසීමා ලකුණු කිරීම.

B. මින්නේරිය වැව කරවීම.

C. පොළොන්නරුව පළමු වරට අගනගරය ලෙස තෝරා ගැනීම.

D. ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය ලබාදීම. (ලකුණු 4)

(iii) ගමක නායකත්වයේ ස්වභාවය පහත මාතෘකා දෙක යටතේ පැහැදිලි කරන්න.

A. ගමික තෝරාගත් ආකාරය.

B. ගමිකගේ කාර්යයන් (ලකුණු 5)

(iv) වසභ රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

04. (i) ඇළහැර ඇළ මගින් පෝෂණය වූ වැව් තුනක් ලියන්න. (ලකුණු 3)

(ii) පහත දැක්වෙන ප්‍රශ්නවලට අදාළ පිළිතුරු නම් කරන්න.

A. කලා ඔය හරස් කොට ධාතුසේන රජු විසින් කරවන ලද වැව

B. කලාවැව හා තිසා වැව යා කර කරවන ලද ඇළ මාර්ගය

C. සොරොව්වේ සිදුර පාලනය කළ දණ්ඩ හැඳින් වූ නම

D. අභයගිරි විහාරයට අයත් කලාත්මක නිර්මාණයක් වූ පොකුණ (ලකුණු 4)

(iii) වැවක දිගුකල් පැවැත්මටත්, ආරක්ෂාවටත් පුරාණ වාරි ඉංජිනේරුවන් විසින් ගත ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න.

(iv) අතීත ශ්‍රී ලංකාවේ දියුණු වෛද්‍ය තාක්ෂණයක් පැවති බවට සාධක තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 6)

05. (i) ශ්‍රී ලංකාවේ දෙවන නාගරිකරණයට අදාළ පැරණි නගර තුනක් ලියන්න. (ලකුණු 3)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ හා සම්බන්ධ පුද්ගලයන් නම් කරන්න.

A. රජරට මාඝ පාලනය කරන විට ගෝවින්දමලය ප්‍රදේශය පාලනය කළ ප්‍රාදේශීය පාලකයා

B. බෙලිගල පර්වත මුදුනේ දළදා මාළිගයක් ඉදිකළ රජු

C. ගම්පොළ යුගයේ ලංකාව ආක්‍රමණය කළ චීන සෙන්පති

D. ජෝතිය සිටුගේ කැරැල්ල මැඩලීමට යැවූ කුමාරයා (ලකුණු 4)

(iii) "දෙවන පරාක්‍රමබාහු රජු දඹදෙණි යුගයේ සිටි ශ්‍රේෂ්ඨතම පාලකයා විය." නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(iv) දෙවන නාගරීකරණ සමයේ ආර්ථිකය වර්ධනය වූ ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 6)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

06. (i) මහනුවර රාජධානියට අයත්ව තිබූ පාලන ප්‍රදේශ අතරින් තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) දෙවන රාජසිංහ රජු මුහුණ දුන් අභියෝග දෙකක් නම් කරන්න. (ලකුණු 4)

(iii) පළමු විමලධර්මසූරිය රජුගේ සේවාවන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 5)

(iv) මහනුවර රාජ්‍ය සමයේ සමාජ සංවිධානයෙහි කැපී පෙනෙන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 6)

07. (i) ඉංග්‍රීසීන් ඉන්දියාවේ පිහිටුවන ලද වෙළෙඳ මධ්‍යස්ථාන තුනක් ලියන්න. (ලකුණු 3)

(ii) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවලින් උපරිම ආර්ථික වාසි සළසා ගැනීමට පෙරදිග ඉන්දිය වෙළෙඳ සමාගම ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 4)

(iii) මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගැනීමෙන් පසු ඉංග්‍රීසින්ට උඩරට ප්‍රදේශ අල්ලා ගැනීමට අවධානය යොමු කිරීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 5)

(iv) පෘතුගීසින්ට ලන්දේසීන්ට මෙන් නොව 1815 දී ඉතා පහසුවෙන් උඩරට රාජ්‍ය අල්ලා ගැනීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 6)

## III කොටස

08. (i) පුනරුද සමයේ ප්‍රසිද්ධියට පත් ඉතාලියේ වෙළඳ නගර තුනක් ලියන්න. (ලකුණු 3)

(ii) පහත දැක්වෙන නිර්මාණ හා සම්බන්ධ පුද්ගලයන් ලියන්න.

A. ගුරුත්වාකරණ නියමය සොයා ගැනීම

B. මොනාලිසා චිත්‍රය සිතුවම් කිරීම

C. ඩිවීනා කොමඩියා ග්‍රන්ථය රචනා කිරීම

D. මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීම

(ලකුණු 4)

(iii) පුනරුදය සමයේ විශ්වය පිළිබඳ ඉදිරිපත් වූ නව මත දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(iv) පුනරුදය නිසා ශ්‍රී ලංකාවට ඇති වූ බලපෑම් තුනක් විස්තර කරන්න. (ලකුණු 6)

09. (i) කාර්මික විප්ලවය මූලික වශයෙන් ආරම්භ වූ කර්මාන්ත ක්ෂේත්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) කාර්මික විප්ලවය එංගලන්තයේ ආරම්භ වීම කෙරෙහි බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 4)

(iii) කාර්මික විප්ලවය නිසා ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(iv) කාර්මික විප්ලවය නිසා සමාජ ක්ෂේත්‍රයේ ඇති වූ අහිතකර ප්‍රතිඵල තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 6)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

1. (අ) (i)
(ආ) (i)
(ඇ) (i)

විභාග අංකය ..............................

54019




බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ඉතිහාසය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) II පත්‍රය ලංකා සිතියම

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner



ඉතිහාසය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) II පත්‍රය ලෝක සිතියම

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

## I කොටස

| | | | |
|---|---|---|---|
| 1) - 3 | 11) - 3 | 21) - 3 | 31) - 2 |
| 2) - 2 | 12) - 2 | 22) - 1 | 32) - 3 |
| 3) - 1 | 13) - 3 | 23) - 1 | 33) - 1 |
| 4) - 2 | 14) - 1 | 24) - 3 | 34) - 2 |
| 5) - 1 | 15) - 3 | 25) - 3 | 35) - 2 |
| 6) - 4 | 16) - 4 | 26) - 2 | 36) - 3 |
| 7) - 2 | 17) - 1 | 27) - 3 | 37) - 2 |
| 8) - 4 | 18) - 3 | 28) - 1 | 38) - 3 |
| 9) - 1 | 19) - 4 | 29) - 4 | 39) - 1 |
| 10) - 1 | 20) - 1 | 30) - 2 | 40) - 2 |

## II කොටස

1) අ) i) A - පණ්ඩුකාභය

B - රොබට් නොක්ස්

C - ගුග්ලි එල්මෝ මාර්කෝනි

D - ජොහැන්නස් ගුටෙන්බර්ග්

ආ) A i) භාතිකාභය රජු

ii) රුවන්වැලි සෑ මලුව

iii) රෝමය

iv) රුවන්වැලි සෑය අංලකාරයට පබළු ගෙන්වා ගැනීමට

B i) ස්පිනිං ජෙනි / ජෙනි යන්ත්‍රය

ii) ජේම්ස් හාග්‍රිව්ස්

iii) පේෂ කර්මාන්තය

iv) නූල් කැටීම වේගවත් කිරීම

2) i) අර්ධ ශුෂ්ක , ශුෂ්ක, තෙත්, පහතරට වියළි , පහතරට අතරමැදි වියළි ආදී පරිසර කලාප 03 ක් ලියා තිබිය යුතුය.

ii) මලමිනී ලෙන තුල හෝ යම් තැනක වැලලීම

ඇටසැකිලි මත ගරුගල් අලේප කිරීම.

ඇටසිකිලි නවා වකුටු කොට වැලලීම.

හිස්කබල සුමට කිරීම ආදී ලක්ෂණ 02 ක් ලියා තිබිය යුතුයි.

iii) කෘෂිකර්මාන්තය ඇරඹීම.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

මැටි බඳුන් නිපදවීම ඇරඹීම.

ස්ථිරවාසිතාව ඇරඹීම.

ලෝහ තාක්ෂණය ඇරඹීම.

රූපලාවණ්‍ය තාක්ෂණය ඇරඹීම.

ක්‍රමවත් සුසාන චාරිත්‍ර ඇරඹීම.

(ප්‍රාග් ඓතිහාසික යුගය සමග සන්සන්දනය කිරීම ලියා තිබිය යුතුය.)

iv) පසේ ස්වාභාවය

වාර්ෂික වර්ෂාපතන අගය

ජල වහනය

භූවිෂමතාවය

3) i) A - රූප අදෙක / රූපදක

B - පන අදෙක

C - මහමත

ii) A - පණ්ඩුකාභය

B - මහසෙන්

C - පළවන විජයබාහු / මහ විජයබාහු

D - දුටුගැමුණු

iii) A - ගමික ගෘහපතීන් අතරින් තෝරාගත් බව

මෙය බුද්ධඝෝෂ හිමිගේ සමන්තපාසාදිකාවේ සඳහන් වූ බව

මෙහිදී වත්පොහොසත් කම සැලකිල්ලට ගත් බව. (ලකුණු 02)

B - ගමට අයත් වැව නඩත්තු කිරීම

ඉන් ජලය බෙදා හැරීම

යුක්තිය පසිඳලීම

ආරවුල් විසඳීම

පොදු කටයුත්තකදී මූලිකත්වය ගැනීම

ගම්නායකයන් සමඟ සාමූහිකව කටයුතු කිරීම (ලකුණු 03)

iv) මහා පරිමාණ වාරිකර්මාන්ත ඇරඹීම

ප්‍රාදේශීය පාලනය විධිමත් කිරීම

වෙහෙර විහාර ප්‍රතිසංස්කරණයට දීමනා ලබාදීම

බදු එකතු කිරීම ක්‍රමවත් කිරීම

ඒකීය ලංකාවක් ඇති කිරීම

4) i) මින්නේරිය ,කවුඩුලු, කන්තලේ , ගිරිතලේ,

ii) A - කලාවැව ,

B - යෝධ ඇළ

C - දියකැට පහණ

D - කුට්ටම් පොකුණ

iii) වැව් බැම්ම ගිලා නොබසින පරිදි සැකසීම

රළ පහරේ බාදනයෙන් වැව් බැම්ම ආරක්ෂා කර ගැනීමට රළ පනාවක් යෙදීම

විශාල වැවක සොරොව් කිහිපයක් යෙදීම

බිසෝ කොටුව මගින් ජල පීඩනය පාලනය කිරීම

අතිරික්ත ජලය පිටවාන මගින් පිට කිරීම

වැව් බැම්ම හොඳින් තලා ඉදි කිරීම ආදී කරුණු විස්තර කර තිබිය යුතුය.

iv) සංකීර්ණ ශෛල්‍ය කර්ම සඳහා භාවිතා කළ ලෝහමය කතුරු හමුවීම.

රෝහල්වල නටඹුන් හමුවීම

සෞඛ්‍ය සේවයට උපකාර කළ රජවරුන් පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් වීම.

බෙහෙත් ඔරු ආදී නටඹුන් හමුවීම.

ඖෂධ උයන් ඉදි කර තිබීම.

වෙද පොත් ලියා බෙදා හැරීම

5) i) දඹදෙණිය , යාපහුව , කුරුණෑගල, ගම්පොල, කෝට්ටේ, මහනුවර,සීතාවක, රයිගම

ii) A - බුවනෙකබාහු ආදිපාද

B - තුන්වන විජයබාහු රජු

C - චෙංහෝ

D - අම්බුලුගල කුමරු

iii) චන්ද්‍රබානු දෙවරක් පරාජය කිරීම

මාඝ ලංකාවෙන් එලවා දමා රට එක්සේසත් කිරීම

දඹදෙණි කතිකාවත කරවීම

දඹදෙණිය දළදා මාලිගය කරවීම

ශාස්ත්‍රීය සේවාවන්ට අනුග්‍රහය දැක්වීම

වෙහෙරවිහාර ප්‍රතිසංස්කරණය කිරීම

පොත පත රචනා කිරීම

iv) ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වීම.

අහස් දියෙන් වී වගා කිරීම.

ජගහිග ප්‍රදේශවල හේන් ගොවිතැන් සිදුකිරීම.

විදේශ වෙළදාමදියුණු වීම

ආර්ථිකය ක්‍රමයෙන් වාණිජකරණය වීම.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

සංවිධානාත්මක අභ්‍යන්තර වෙළඳාමක් පැවතීම.
අපනයන බෝග හා අපනයන ද්‍රව්‍ය ( පුවක්, ගම්මිරිස්ථ එනසාල්, සාදික්කා , මුතු මැණික් ඇතුන් හා ඇත්දල)

6) i) හත්කෝරළය , ඌව , මාතලේ, වළපනේ, බිම්තැන්න, වෙල්ලස්ස, නුවර කලාවිය, හතර කෝරළය , තුන් කෝරළය , සබරගමුව ආදී ප්‍රදේශ තුනක් නම් කිරීම අපේක්ෂා කෙරේ. ( 10 පෙළපොත 112 පිටුව)

ii) පෘතුග්‍රීසීන්ගෙන් උඩරටට එල්ලවල ප්‍රහාර මැඩ පැවැත්වීම.
පෘතුග්‍රීසීන් ලංකවෙන් නෙරපා හැරීම.
ලන්දේසීන් අල්ලාගත් ප්‍රදේශ නැවත උඩරටට ලබා ගැනීම.
රදළ ප්‍රධානීන්ගේ තර්ජන අවම කර ගැනීම.

iii) උඩරට සීතාවක ග්‍රහණයෙන් බේරාගැනීම.
පෘතුග්‍රීසි බලපෑමෙන් උඩරට බේරා ගැනීම.
පරිහානියට පත් බුදු සසුන නගා සිටුවීම.
උඩරට ආර්ථිකය දියුණු කිරීම.
නව රජපෙළපතක් ආරම්භ කිරීම

iv) සමාජ සබඳතා කුල ක්‍රම මත පදනම් වීම.
ඉඩම් අයිතිය හා භුක්තිය පදනම් කරගෙන කොටස් කිහිපයකට බෙදා තිබීම.
මූලික විවාහ ක්‍රම තුනක් පැවතීම
ස්වයං පෝෂිත ජන සමාජයක් පැවතීම
සහජීවනය හා ගුණ ගරුක බව සමාජයේ දක්නට ලැබීම
රජකාරී ක්‍රමයක් පැවතීම

7) i) මදුරාසිය, කල්කටා, බොම්බාය, සුරාත්, ට්‍රැවන්කොර්, මසුලිපටම් ආදී ස්ථාන තුනක්

ii) නව බදු වර්ග පැනවීම
බදු එකතු කිරීමට අවුමිල්දාර්වරුන් පත් කිරීම
බදු මුදලින්ම ගෙවීමට නියම කිරීම
බදු එකතු කිරීමේ අයිතිය වෙන්දේසියේ විකිණීම

iii) රට මැද ස්වාධීන රාජ්‍යක් පැවතීම බ්‍රිතාන්‍ය පාලනයට කිහිප ආකාරයකින් බාධාවක් වීම.
කඩවත් බදු ගෙවීමට සිදුවීම
දේශ සීමා දෙකක් එකවර ආරක්ෂා කිරීමට සිදුවීමෙන් යුද වියදම් අධික වීම
පහතරට ඇතිවන කැරලි වලට උඩරට රජු උදව් ලබාදීම
පහත රට ජනතාව පවා උඩරට රජු තමන්ගේ රජු ලෙස පිළිගැනීම
උඩරට රජු ප්‍රංශ ජාතිකයන් සමඟ එක් වේ යැයි ඉංග්‍රීසීන්ට බියක් ඇති වීම

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

iv) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු ජනතා අප්‍රසාදයට පත්වීම.

රදළ වරුනගේ සහය ඉංග්‍රීසීන්ට ලැබීම.

ජෝන් ඩොයිලිගේ උපක්‍රමශීලි ක්‍රියා කලාපය

8) i) වැනීසිය, ජිනෝවා, රෝමය , ෆ්ලෝරන්ස්

ii) A - අයිසෙක් නිවුටන්

B - ලියනාඩෝ ඩාවින්චි

C - අලගියරි ඩාන්ටේ

D - ජොහැන්නස් ගුටෙන්බර්ග්

iii) පෘතුවිය ගෝලාකාර බව

සූර්යය කේන්ද්‍රිය වාදය

පෘතුවිය සූර්යා වටා ඉලිප්සාකාර පථයක ගමන් කරන බව

ගුරුත්වාකර්ෂණ නියමය

දුරේක්ෂය මගින් පෘතුවියට සමීප ආකාෂ වස්තු නිරීක්ෂණය කිරීම

iv) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ලැබීම

රෝම ලන්දේසි නීතිය ලැබීම

නව නිලධාරී පැලැන්තියක් ඇති වීම

ස්වංය පෝෂිත ආර්ථිකය බිඳ වැටීම

නව නගර ඇති වීම.

බටහිර අධ්‍යාපන ක්‍රමය ලැබීම

රෝමාන් කතෝලික සහ රෙපරමාදු ආගම් ලැබීම

මුද්‍රණ ශිල්පය ලංකාවට හඳුන්වාදීම

9) i) පේෂ කර්මාන්තය ,යකඩ හා වානේ ,ගල් අඟුරු

ii) ප්‍රාග්ධනය බහුලව පැවතීම

අමුද්‍රව්‍ය බහුලව පැවතීම

ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය නිසා ලාබදායි ශ්‍රමය

හොඳ වෙළඳපොළක් පැවතීම

දියුණු වාහන ක්‍රමයක් පැවතීම

කුඩා දිවයිනක් වීම ආදී කරුණු දෙකක්

iii) මහා මාර්ග ඉදිවීම

දුම්රිය මාර්ග ඉදිවීම

කොළඹ වරාය සංවර්ධනය වීම

මැකඩම් ක්‍රමයට අනුව මාර්ග තැනීම

ලී පාලම් වෙනුවට යකඩ පාලම් භාවිතා කිරීම

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

iv) පරිසර දූෂණය

පවුල් සංස්තාව බිඳ වැටීම

නාගරීකරණය හා බැඳුනු සමාජ ගැටළු ඇති වීම

ශ්‍රම සූරා කෑම

කම්කරුවන්ගේ ජීවන තත්වය අයහපත්වීම

1. (අ) (i) විභාග අංකය ............................



දඹකොළ පටුන
N
ඉරණමඩු වැව
මාන්තොට
කොණේශ්වරම් කෝවිල
පොම්පරිප්පු
හුරුළුවැව
කලා ඔය
මහනුවර
කොළඹ
සංගමන්කන්ද
කිරිඳි ඔය
දෙවුන්දර




iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources